**වරකාපොල ප්‍රාදේශීය සභාවේ - 2021**

**----------------------------------------**

1 මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

වරකාපොල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වරකාපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූෂ්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලනකල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් එකතුව රු. 2,233,000 ක් වටිනාකමැති උපකරණ 03ක් කාර්යාල උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි | ප්‍රාග්ධන හා අයභාර වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කලයුතුයි. |
| (ආ) | ව්‍යාපාර බදු ලෙජර් ගිණුමක් පවත්වාගෙනගොස් නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 307,257 ක හිඟ ශේෂය හා වර්ෂයේ බිල් කිරීම් රු. 2,000,000 ක වටිනාකම නොසලකා මුදලින් ලැබීම් රු. 1,134,500 ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 865,500 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර වර්ෂය අවසානයට ලැබිය යුතු ව්‍යාපාර බදු ආදායම් රු. 1,172,757 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂ ආරම්භයේ ව්‍යාපාර බදු හිඟ ශේෂයක් නොපැවතුණ බවත් පෙන්වා ඇති හිඟය පෙර වර්ෂයේ ඇස්තමේන්තු ගත මුදලින් එම වර්ෂයේ ලැබීම් අතර වෙනස බවත් 2021 වර්ෂයේ ව්‍යාපාර බදු රු.2,000,000 වර්ෂයේ බිල් කිරීම නොව ඇස්තමේන්තුව බවත් වර්ෂය අවසානයට ලැබිය යුතු ව්‍යාපාර බදු ශේෂයක් නොමැති බවත් දන්වා තිබුණි. | ව්‍යාපාර බදු බිල් කිරීම වර්ෂය ආරම්භයේ නිවැරදිව සිදුකල යුතු අතර ඒ අනුව ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කලයුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සිට උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් මුදල් පදනම මත ගිණුම් තැබීම හේතුවෙන් පෙර වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේ ලැබුණු රු. 40,003,478 ක මුද්දර ගාස්තු ආදායමට ගැනීම නිසා එම ප්‍රමාණයෙන් ආදායම් වැඩිවීම සහ සමාලෝචිත වර්ෂයේ ආරම්භක උසාවි දඩ හිඟ ශේෂය රු.8,624,266 ක් සමුච්චිත අරමුදලට හර කිරීම නිසා එම ප්‍රමාණයෙන් සමුච්චිත අරමුදල හා ජංගම වත්කම් අඩුවී තිබීම, සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි. | නිරීක්ෂණ පිළිගෙන තිබුණි. | ගිණුම් තැබීමේ පදනම වෙනස්වීම හේතුවෙන් සමුච්චිත අරමුදල හා ජංගම වත්කම් අඩුවීම සටහන් මගින් හෙළිදරව් කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවේ නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා සැලසුම් සකස් කිරීම වෙනුවෙන් දැරූ රු. 6,000,000 ක වියදම ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට, පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ මෙහෙයුම් ලාභය අඩුවෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණ පිළිගෙන තිබුණි. | ප්‍රාග්ධන හා අයභාර වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කලයුතුයි. |

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 14කට අදාලව මූල්‍ය ප්‍රකාශන හා අදාල උපයෝගී ලේඛන අතර රු.41,496,820 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර පවතින වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කලයුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති,රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| සබරගමුව පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 01/2010 දරන චක්‍රලේඛයේ 7.4(iv)ඡේදය | වෛද්‍ය හේතුන් නොවන හෝ පළාත් පාලනයට අදාල නොවන හේතුන් මත 2021 වර්ෂය තුල සභාවට නොපැමිණි සභිකයින් 34 දෙනෙකුට දින 62 ක් සඳහා සභික දීමනා රු. 930,000ක් ගෙවා තිබුණි. | ගරු මන්ත්‍රීවරුන්ට නිවාඩු ලබා ගන්නා විට අසනීප නම් වෛද්‍ය වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දීමක් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිපල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 36,951,441 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 31,999,942 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
---------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම්<br>---------<br>සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු වරිපනම් බදු ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු. 3,364,791 ක් වුවද, වරිපනම් ලේඛනය අනුව රු. 4,240,890 ක් වූ අතර, එය රාජ්‍ය අංශයේ වරිපනම් ඒකක 83කින් හා පෞද්ගලික අංශයට අයත් වරිපනම් ඒකක 175කින් යුක්ත වේ. එම හිඟය තුල කාලය නිශ්චිතව හඳුනාගත නොහැකි රු. 2,321,699 ක ශේෂද පැවතුණි | මේවන විට 2014 දක්වා හිඟ ශේෂ පිළිබඳ වෙනස්කම් හඳුනාගෙන ඇති බවත්, 2015 සිට ඉදිරියට සෙවීමේදී ආදායම් පරීක්ෂක ක්ෂේත්‍ර ලදුපත් යම් ප්‍රමාණයක් සොයාගැනීමට නොහැකි වී ඇති බැවින් 2018 වර්ෂයේ සිට ආපස්සට එම ශේෂයන් නිවැරදි කිරිමට කටයුතු කරමින් ඇති බවත්, වර්තමානයේ නව පරිඝනක මෘදුකාංගයක් හරහා වරිපනම් හා අක්කර බදු නිවැරදිව අය කරමින් පවතින අතර මෙම හිඟය පිළිබඳ ඉදිරියේදී සොයා බලා කටයුතු කරන බවත් දන්වා තිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කලයුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
-------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 සැප්තැම්බර් 29 හා 2012 ජනවාරි 5 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක 01 /2021 හා 01/2012 චක්‍රලේඛයන්හි පිළිවෙලින් 2.4, 2.5, 3.3 හා 3.4 වගන්ති ප්‍රකාරව කොන්ත්‍රාත්තු පිරිනමන අවස්ථාවේදී අදාල ප්‍රජාපාදක සංවිධානය කොන්ත්‍රාත් 3 කට වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක නිරතවී නොසිටිය යුතු අතර, අදාල කොන්ත්‍රාත්තුව සමිති | 2021 වර්ෂයේ දී විශාල කර්මාන්ත සංඛ්‍යාවක් නිම කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් වී තිබුණු අතර කඩිනමින් එම කර්මාන්ත නිම කිරීමට අවශ්‍ය වූ බැවින් වරකාපොල විවිධ සේවා සමුපකාරය වෙත කොන්ත්‍රාත්තු පිරිනමා ඇති බවත් එය ප්‍රාදේශීය ලේකම් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතුය. |

බලප්‍රදේශයේ විය යුතු වේ. එසේ නොවන අවස්ථාවලදී දිස්ත්‍රික් ලේකම් වරයාගේ අනුමැතිය ඇතිව කොන්ත්‍රාත් තුනකට වඩා වැඩි ප්‍රමාණයක් ලබාදිය හැකි වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සීමාසහිත වරකාපොල විවිධ සේවා සමුපකාර සමිතිය වෙත 2021 වර්ෂයේදී එකතු වටිනාකම රු. 27,633,656 ක් වූ කර්මාන්ත 74 ක් ලබාදී තිබුණි. එය 2021 වර්ෂයේදී සභාව විසින් ගිවිසුම්ගතව තිබුණු මුළු කර්මාන්ත වටිනාකමින් සියයට 49 ක ප්‍රමාණයක් විය. කොට්ඨාශයම ආවරණය වන පරිදි පිහිටුවා ඇති සමිතියක් බැවින් අදාල කොන්ත්‍රාත්තු පිරිනමා ඇති බවත් දන්වා තිබුණි.